**යාපනය විශ්වවිද්‍යාලය විද්‍යායතනය - 2018**

--------------------------------------------------------------

**1.1 තත්ත්වාගණනය නොකළ මතය**

---------------------------------------

යාපනය විශ්වවිද්‍යාලය විද්‍යායතනයේ ("විද්‍යායතනයේ") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

------------------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 104 | විද්‍යායතනයට පවරා ඇති වාහනයක් 2018 නොවැම්බර් 03 දින අනතුරකට ලක්ව ඇති අතර අනතුර පිළිබඳ අවසන් වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | හානියේ ප්‍රමාණය ඉතා ඉහළ මට්ටමක පැවති බැවින් අලුත්වැඩියා කිරීමේ වගකීම අමාත්‍යාංශය විසින් භාරගෙන තිබේ. එම අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ යම් ප්‍රමාදයන් හේතුවෙන් කාලය ගත විය. දැනට අමාත්‍යාංශය විසින් අලුත්වැඩියා කිරීම සඳහා නිර්දේශිත ගරාජ වලින් මිල ගණන් ලබා ගැනීම ආරම්භ කර ඇති අතර, සත්‍ය පාඩුව මෙතෙක් හඳුනාගෙන නැත. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 110 | අලාභ හා හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | 2017 සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවෙන් වාර්තාවක් ලැබුණු පසු මේ සම්බන්ධයෙන් පියවර ගනු ලැබේ. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) මුදල් රෙගුලාසි 272 (3) | සියලුම ගෙවූ වවුචර ඒවාට අදාළ මාසය අවසානයේ සිට සති හයකට නොවැඩි කාලයක් ඉකුත් වීමට මත්තෙන් විගණකාධිපති වෙත මසක් පාසා යැවිය යුතු වුවද, එම වවුචර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වවුචර් නිතිපතා විගණනය සඳහා යොමු කරනු ලැබේ. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (iv) මුදල් රෙගුලාසි 757 | වර්ෂය තුළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල ක්‍රියාත්මක කර නොතිබුණි. | 2018 සමීක්ෂණ මණ්ඩලය සඳහා කමිටුවක් කළමනාකරණ මණ්ඩලය විසින් 2018.12.20 දින පත් කරන ලද අතර, 2018 සමීක්ෂණ මණ්ඩලයේ කමිටුවේ වාර්තාව අපේක්ෂා කෙරේ. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |

**(ආ) චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) අංක IAI/2002/02 හා 2 002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නිසි ලෙස නඩත්තු කර නොතිබුණි. | ලේඛනය නඩත්තු කිරීමට පියවර ගනිමින් සිටී | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ii) 2003 ජුනි 02 දිනැති අංක PED/12 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව කළමනාකරණ මණ්ඩලය විසින් විශ්ලේෂණාත්මකව සමාලෝචනය කර කාර්තුව අවසන් වී දින 30 ක් ගතවීමට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට සහ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද විද්‍යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එවැනි වාර්තාවක් භාණ්ඩාගාරයට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සතු වගකීමකි. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට සියළුම විශ්වවිද්‍යාල විද්‍යායතනවල වාර්තාකරණයේදී කාර්ය සාධනය ඇතුළත් වේ. | කාර්යසාධන වාර්තාවක් කාලීනව අදිළ ආයතනවලට ඉදිරිපත් කළ යුතුය. |

**1. 6 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාස හයක් තුළ ගෙවිය යුතු රු. 394,080 ක් වටිනාකමැති චෙක්පත් 14 ක් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව වගකීමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | චෙක්පත් ලබා ගන්නා ලෙස ලබන්නන්ට දන්වා තිබුණද සමහරු එසේ ලබාගෙන නොතිබුණි. සමහරු අතින් චෙක්පත් නැතිවී තිබූ අතර සමහරු එය තැන්පත් තැන්පත් කර නොතිබුණි. එළඹෙන රැස්වීමේදී කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කළ පසු ඉදිරිපත් නොකළ චෙක්පත් බැර කිරීමට පියවර ගනු ලැබේ. | හිඟ මුදල් සියල්ල ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,090,327 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 6,677,760ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,587,433 ක වර්ධනයක් නිරීක්ෂණය විය. එම වැඩිවීමට රජයේ ප්‍රතිපාදන රු. 2,308,051 කින් ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3. 1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු. 36,755,265 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර වසර 3 කට වැඩි කාලයක් තිස්සේ අපේක්ෂිත අරමුණු සඳහා පූර්ණ ලෙස භාවිතා කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් රැස්කරගත් තොරතුරු දෙපාර්තමේන්තු ප්‍රධානියා සමඟ හෝ මෙම උපකරණ සමඟ ඉගැන්වීමට සම්බන්ධ පුද්ගලයින් වන ගුරු කාර්ය මණ්ඩලය සමග පරීක්ෂා කර හෝ තහවුරු කර නොමැති බව දක්නට ලැබුණි.<br><br>(අ) <u>ගොවිපල යන්ත්‍රෝපකරණ තාක්ෂණය</u><br><br>රෝද දෙකේ ට්‍රැක්ටරය සහ ස්වයං-ප්‍රචලිත වී අළුත්වැඩියාව NVQ, 5 වන මට්ටම සහ 6 වන මට්ටමේ ඉගැන්වීම් මොඩියුල සඳහා යොදා ගනු ලබයි. නමුත් මෙම උපකරණයේ ප්‍රායෝගික භාවිතයන් සහ ඉගැන්වීම් සඳහා සීසෑම හා අස්වනු නෙලීම සඳහා නිරූපණයක් සඳහා ක්ෂේත්‍රයක්/ඉඩමක් අවශ්‍ය වේ. අපට දැනට ඉඩම්/ක්ෂේත්‍රයක් නොමැති බැවින් එය ඌන උපයෝජනය වී ඇත.<br><br>(ආ) <u>නිෂ්පාදන තාක්ෂණය</u><br><br>සීඑන්සී වයර් කපන ඊඩීඑම් යන්ත්‍රයේ යන්ත්‍රෝපකරණ NVQ, 6 මට්ටමේ ඉගෙනුම ලබන සිසුන්ට නිෂ්පාදන තාක්ෂණයේ මොඩියුලය ප්‍රායෝගිකව ඉගැන්වීම සඳහා යොදා ගනී. එබැවින් එය නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝගී තත්ත්වයේ නැත. | අපේක්ෂිත අරමුණු සඳහා යන්ත්‍ර ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම අවශ්‍ය වේ. |

(ඇ) <u>ආහාර තාක්ෂණය</u>

TVEC අනුමත විෂය මාලාවට අනුකූලව NVQ, 5 වන මට්ටම සහ NVQ, 6 වන මට්ටමේ සිසුන්ට ඉගැන්වීම සඳහා බ්ලාස්ට් ෆ්‍රීසර් / ප්ලේට් ෆ්‍රීසර් භාවිතා කරයි. එය ඌන උපයෝජයක් වුවද,, විෂය මාලාවට අනුව එය ඉගැන්වීම සඳහා අවශ්‍ය උපකරණකි.

**3. 2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනය විසින් විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු. 12,630,553 ක මුදලක් පසුගිය වසර 3 ක කාලය තුළ සහකාර ලේඛකාධිකාරීවරයෙකුට, සහකාර මූල්‍යාධිකාරීවරයෙකුට සහ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකුට ගෙවා තිබුණි. | ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී සහ පුස්තකාලයාධිපතිවරුන් සඳහා සියලුම විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් සිටින අතර ආරම්භක අවස්ථාවේ දී වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය තෝරා ගැනීම සිදු කරන ලදී. සියලුම විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී සහ පුස්තකාලයාධිපතිවරුන් පත් කිරීම වෙනුවට සහකාර ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී සහ පුස්තකාලයාධිපති පත්කර ඇත. ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී සහ පුස්තකාලයාධිපතිවරුන්ගේ කාර්ය මණ්ඩලය පිළිවෙලින් සහකාර ලේඛකාධිකාරී, සහකාර මූල්‍යාධිකාරී සහ සහකාර පුස්තකාලයාධිපතිවරුන්වරුන් බවට පත් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අයදුම්පත් දැනටමත් ඉදිරිපත් කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව, කාර්තුමය ඉලක්ක සහිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සහ එම ඉලක්ක සඳහා වගකිව යුතු නිලධාරීන්ගේ තොරතුරු විද්‍යායතනය විසින් සකස් කර නොතිබුණි. | කාර්තුමය ඉලක්කයක් සහිත ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය යුතුය. |

**4.2** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක. DMA/2009(1) හා 2009 ජුනි 09 දිනැති මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතා රාශියක් නිරීක්ෂණය විය. | අභ්‍යන්තර ඒකකයක් පිහිටුවීමේ නිර්දේශය ළඟදීම ලැබෙනු ඇත. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම අවශ්‍යවේ. |

**4.3** **විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුවක් ස්ථිපිත කර නොතිබුණි. | විගණන කමිටුවක් පිහිටුවීමේ නිර්දේශය ඉක්මනින් ලැබීමට නියමිතය. | විගණන කමිටුවක් ස්ථිපිත කිරීම අවශ්‍ය වේ. |

**4. 4** **තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සෑම රාජ්‍ය ආයතනයක්ම එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු සඳහා වන 2030 න්‍යාය පත්‍රයට අනුකූලව කටයුතු කළ යුතු අතර 2017 අංක 19 දරණ තිරසාර සංවර්ධන පනත 2017 ඔක්තෝබර් 03 දින සම්මත කර ගැනීමෙන් පසු සියලුම රාජ්‍ය ආයතන චක්‍රලේඛ මගින් ඉහත කරුණු පිළිබඳව දැනුවත් කර තිබුණි. ඒ අනුව, අදාළ ආයතනයේ විෂය පථයට අයත් කාර්යයන් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සියලු රාජ්‍ය ආයතන දැනුවත් විය යුතුය. එසේ වුවද, ඉහත කරුණ පිළිබඳව විද්‍යායතනය නොදැන සිටි හෙයින්, එහි ක්‍රියාකාරිත්වයට අදාළ අරමුණු හා ඉලක්ක සහ එම ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය දර්ශක විද්‍යායතනය විසින් හඳුනාගෙන නොතිබුණි. | 2017 ඔක්තෝබර් 03 දිනැති අංක 19 දරණ තිරසාර සංවර්ධන පනතේ චක්‍රලේඛය භාවිතා කරමින් එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට පියවර ගනු ලැබේ. | තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගත යුතුවේ. |